නීතිපති දෙපාර්තමේන්තුව

சட்டமா அதிபதி திணைக்களம்

Attorney General's Department



# කාර්ය සාධන වාර්තාව - 2021

# செயலாற்றுகை அறிக்கை - 2021

# Performance Report - 2021

**2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව**
**නීතිපති දෙපාර්තමේන්තුව**
**වැය ශීර්ෂ අංකය. 229**


| | | |
|---|---|---|
| පරිච්ඡේදය 01 | - | ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය |
| පරිච්ඡේදය 02 | - | ප්‍රගතිය හා ඉදිරි දැක්ම |
| පරිච්ඡේදය 03 | - | වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය |
| පරිච්ඡේදය 04 | - | කාර්ය සාධන දර්ශක |
| | | තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය |
| පරිච්ඡේදය 05 | - | සාධනය |
| පරිච්ඡේදය 06 | - | මානව සම්පත් පැතිකඩ |
| පරිච්ඡේදය 07 | - | අනුකූලතා වාර්තාව |

## 01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.3. ප්‍රධාන කාර්යයන්

1.4. සංවිධාන සටහන

1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශිය ලේකම් කාර්යාල

1.6. අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/පළාත් සභාව යටතේ පවතින ආයතන/අරමුදල්

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

(අ) ව්‍යාපෘතියේ නම

(ආ) දායක නියෝජිතායතනය

(ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම-රු.මි.

(ඈ) ව්‍යාපෘති කාල සීමාව

## 02 පරිච්ඡේදය-ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## විශේෂ ජයග්‍රහන, අභියෝග හා ඉදිරි ඉලක්ක

ප්‍ර.ග.නි./ග.නි./ආයතන ප්‍රධානියා විසින් අත්සන් කළ යුතුය.

## දැක්ම

❖ ශ්‍රී ලංකාව වෙනුවෙන් සහ එහි ජීවත්වන සියලුම ජනතාව වෙනුවෙන් යුක්තිය හා සාධාරණත්වය ඉෂ්ඨ කිරීම සඳහා එළඳායි ලෙස ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලියේ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය ලෙස කටයුතු කිරීම.

## මෙහෙවර

❖ ශ්‍රී ලංකාවේ අපේක්ෂාවන් සපුරාලීම උදෙසා, ගෞරවනියවත් අභිමානවත් ලෙසත් අවංක ලෙසත් කටයුතු කිරීම සහ අපගේ උපරිමයෙන් ශ්‍රී ලාංකික ජනතාවට සේවය කිරීම.

❖ සමාජීය ආර්ථික සෞභාග්‍ය, සම අවස්ථාවන් සහ මානව දයාව දිරිගැන්වීමේ ප්‍රයත්නයේ දී ශ්‍රී ලාංකිය ජනතාව උදෙසා සාධාරණත්වය , ආරක්ෂාව සහ ස්වාධීනත්වය තහවුරු කරනු වස්, අපක්ෂපාතිව සහ සාධාරණ ලෙස ශ්‍රී ලංකාවේ නීතිත් ක්‍රියාත්මක කිරීමට නීතිපති දෙපාර්තමේන්තුව ප්‍රයත්න දරනු ඇත.

## අරමුණ

❖ ශ්‍රී ලංකා රජය සහ රජයේ ආයතන, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා අවශ්‍ය සියලුම නෛතික සේවාවන් සහ නීති උපදෙස් නොපමාව සැපයීම සහ රජයේ පුළුල් අරමුණු ව්‍යාප්ත කිරීමේ ක්‍රියාවලියේ දී සුවිශේෂි මෙහෙවරක් ඉටු කිරීම.

## නීතිපති දෙපාර්තමේන්තුව

## (තැ.පෙ. අංක 502, කොළඹ 12.)

### හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් පෙනී සිටින ප්‍රධාන නීති නිලධාරියා නීතිපතිවරයා වන අතර දෙපාර්තමේන්තු ප්‍රධානියා හා ගණන් දීමේ නිලධාරියා වශයෙන් ගරු නීතිපතිතුමා කටයුතු කරයි. ඒ ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වන නීතිපති දෙපාර්තමේන්තුව අධිකරණ අමාත්‍යාංශය භාරයේ පවතී.

නීතිපති දෙපාර්තමේන්තුව මධ්‍යම රජයට, පළාත් සභාවලට, රජයේ දෙපාර්තමේන්තුවලට, ව්‍යවස්ථාපිත මණ්ඩල හා අනිකුත් අර්ධ රාජ්‍ය ආයතනවලට නීතිමය සහාය ලබාදෙයි. එකී සහාය ලබාදීමේ දී දෙපාර්තමේන්තුවේ නීති නිලධාරීන් විසින් ප්‍රධාන වශයෙන් සිවිල්, අපරාධ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ වාණිජ යන කාරණා සම්බන්ධයෙන් රජයට සහ රජයට අයත් ආයතන වලට උපදෙස් දීමත්, දිවයිනේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අනිකුත් අධිකරණවල හා කම්කරු විනිශ්චය සභාවල පවරා ඇති නඩු වලදී රජය සහ රාජ්‍ය ආයතන නියෝජනය කිරීමත් සිදු කරනු ලැබේ.

සිවිල් අංශය, අපරාධ නඩු අංශය හා රාජ්‍ය නීතිඥ අංශය වශයෙන් ප්‍රධාන අංශ තුනක් මගින් දෙපාර්තමේන්තුවේ සිවිල් හා අපරාධ නඩුවලට අදාලව කටයුතු ඉටු කරනු ලබන අතර පරිපාලන කටයුතු මෙහෙයවීම සඳහා ආයතන අංශය හා ගිණුම් අංශය ස්ථාපිත කර ඇත. මෙම අංශවලට අමතරව දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට සංස්ථා අංශය,ළමා ආරක්ෂණ ඒකකය, ආගමන හා විගමන ඒකකය, මහජන පැමිණිලි ඒකකය, ශ්‍රේෂ්ඨාධිකරණ ඒකකය යන ඒකක නීතිපති දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මකව පවතී.

## නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පහත පරිදි සංක්ෂිප්තව දැක්විය හැක.

- සිවිල් අපරාධ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා, වාණිජ යන කරුණු, ජාත්‍යන්තර නීති කටයුතු සහ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමට අදාල කාරණා සම්බන්ධයෙන් රජයට සහ රජයට අයත් ආයතන වලට උපදෙස් දීම.
- දිවයිනේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අනිකුත් අධිකරණවල හා කම්කරු විනිශ්චය සභාවල පවරා ඇති නඩු සම්බන්ධයෙන් රජය සහ රාජ්‍ය ආයතන නියෝජනය කිරීම.
- නව නීති සම්මත කිරීමේදී හා පවතින නීති සංශෝධනය කිරීමේදී අවශ්‍ය නෛතික උපදෙස් ලබාදීම.

ඉහත කාර්යයන් ඉටු කිරීමේ දී දෙපාර්තමේන්තුවේ පහත දක්වා ඇති අංශ නීති කාර්ය මණ්ඩලයට සහාය වෙයි.

- අපරාධ නඩු අංශය
- සිවිල් අංශය
- රාජ්‍ය නීතිඥ අංශය
- ශ්‍රේෂ්ඨාධිකරණ ඒකකය
- අභියාචනාධිකරණ ඒකකය
- සංස්ථා අංශය

තවදදෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට විශේෂ වශයෙන් හඳුනාගත් වගකීම් පවරා ඇති විශේෂ ඒකක ද ක්‍රියාත්මක වේ.

එම ඒකක වන්නේ;

මහජන පෙත්සම් ඒකකය(මහජන පෙත්සම් සම්බන්ධයෙන් කටයුතු කිරීම.)

- ළමා ආරක්ෂණ අංශය ඒකකය (ළමුන් අපචාරවලට ලක් කිරීමටඅදාල නඩු පිළිබඳ ක්‍රියා කිරීම.)

නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉටුවිය යුතු ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම සඳහා ඉහත කී අංශ සහ ඒකක කටයුතු කරනු ලබන අතර නීතිපති දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු මෙහෙයවීම සඳහා ආයතන අංශය. ගිණුම් අංශය හා ප්‍රවාහන අංශය ස්ථාපිත කර ඇත.

## 1.4. නීතිපති දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



**1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යා**

පළාත් සහ ප්‍රදේශීය මට්ටමින් නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්යාල ස්ථාපනය කිරීමට සැලසුම් කර ඇත.

අදාල ප්‍රදේශීය අධිකරණ බල සීමාව තුල පිහිටා ඇත රජයේ අධිනීතිඥ නිල මැදිරි හරහා අදාල අධිකරණ කලාපයක් තුලට අන්තර්ග්‍රහණය කරනු ලැබූ රජයේ අධිනීතිඥවරු විසින් තම රාජකාරීන් සිදු කරනු ලබයි.

ඒ අනුව මේ වන විට දිප ව්‍යාප්තව රජයේ අධිනීතිඥ නිල මැදිරි 52 ක් පිහිටුවා ඇත

මීට අමතරව උතුරු පළාතේ නීතිපති දෙපාර්තමේන්තුවට අයත් රාජකාරිමය කටයුතු අධීක්ෂණයට වව්නියාවේ ඉරට්ටපෙරියකුලම් හි නීතිපති දෙපාර්තමේන්තුවේ පළාත් බද නීතිපති නිල නිවසට යාබදව මෙම දෙපාර්තමේන්තුවට රජය මගින් පවරා දෙනු ලැබූ පර්චස් 20 ක භූමියේ උතුරු පළාත සඳහා වන කාර්යාලය ස්ථාපනය කිරීමට නියමිතය. එකී කාර්යාලය උතුරු පළාත සඳහා මෙම දෙපාර්තමේන්තුව මගින් පත් කර ඇති ප්‍රධාන අධීක්ෂණ නිලධාරී අතිරේක සොලිසිටර් ජනරාල්වරයා හරහා පරිපාලනයට නියමිතය.

## 1.6. අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/පළාත් සභාව යටතේ පවතින ආයතන/අරමුදල්

නීතිපති දෙපාර්තමේන්තුව යටතේ පවතින අංශ කිපයකි.

- සංස්ථා අංශය
- ළමා ආරක්ෂණ අංශය
- මහජන පෙත්සම් අංශය
- ආගමන විගමන අංශය
- CR 3

ඒ ඒ අංශ වල කාර්යයන් මෙහෙයවීම සහ පරිපාලනය සඳහා විවිධ අරමුදල් පවතී.

- සංස්ථා අංශය - මහා භාණ්ඩාගාරය විසින් වාර්ෂිකව වෙන් කරනු ලබන මූල්‍යමය ප්‍රතිපාදනයටතේ මෙම අංශය ක්‍රියාත්මක වේ. කෙසේ නමුත් සංස්ථා අංශය විසින් සිදු කරනු ලබන වෘත්තීමය නීති සේවා සඳහා අදාළ ගාස්තු සංස්ථාපිත ආයතන, අර්ධ රාජ්‍ය ආයතන හරහා සංස්ථා අංශයට බැර වූ පසු එකී මුදල් ඒකාබද්ධ අරමුදල වෙත බැර කරනු ලැබේ.

# 02 පරිච්ඡේදය

# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

# විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

## විශේෂ ජයග්‍රහණ

**1.** නඩු ගොනු පිළිබඳ කාර්යසාධනය

| ශාඛාව | නඩු වර්ගය | 2020 වර්ෂයේ සිට ඉදිරියට ගෙන ආ නඩු ගොනු සංඛ්‍යාව | 2021.01.01 සිට 2021.12.31 දක්වා පවරන ලද නඩු ගොනු සංඛ්‍යාව | 2021.01.01 සිට 2021.12.31 දක්වා අවසන් කරන ලද නඩු ගොනු සංඛ්‍යාව | 2021.12.31 දින වන විට පවතින සජීවී නඩු ගොනු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| සිවිල් අංශය * | උපදෙස් ගොනු | 879 | 1,453 | 583 | 1,749 |
| | අධිකරණ නඩු ගොනු | 749 | 1,756 | 6 | 2,499 |
| රාජ්‍ය නීතිඥ අංශය | සිවිල් අංශයෙන් ලද ගොනු | 11,410 | 172 | 307 | 11,275 |
| | +L | - | 214 | - | 214 |
| | SB | 84 | 7 | - | 91 |
| | LA | - | 9 | - | 9 |
| | **එකතුව** | **11,494** | **402** | **307** | **11,589** |
| අපරාධ නඩු අංශය | මිනී මැරීමට තැත්කිරීම හා මිනී මැරීම | | 498 | 606 | |
| | අන්තරාදායක ඖෂධ පනත (හෙරොයින්) | | 1,262 | 1,318 | |
| | ස්ත්‍රී දූෂණ (ද.නි.ස 365) | | 223 | 217 | |
| | ගණිකා වෘත්තිය (ද.නි.ස 360) | | 7 | 16 | |
| | පීඩාකාරී ආයුධ පනත | 7,379 | 45 | 24 | **6390 |
| | ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත | | 283 | 119 | |
| | රථ වාහන අනතුර (ද.නි.ස 298) | | 22 | 20 | |
| | පොදු දේපළ පනත | | 34 | 50 | |
| | මුදල් වංචා (ද.නි.ස 383) | | 220 | 295 | |
| | වෙනත් අපරාධ | | 907 | 1,448 | |
| | **එකතුව** | **7,379** | **3,501** | **4,113** | **6,390** |

| | | | | | |
|---|---|---|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණ අංශය | SC FR, SC Writ, SC SD, SC Contempt of Court | 847 | 477 | 229 | 1,095 |
| සංස්ථා අංශය | කම්කරු විනිශ්චය සහා ඇතුළු අධිකරණමය නඩු ගොනු සහ උපදෙස් ගොනු | 6,928 | 2,518 | 1,312 | 8,134 |
| ළමා ආරක්ෂණඅංශය | ළමා අපචාර | **4719 | 2,073 | 4,557 | 2,235 |
| මහජන පෙත්සම් අංශය | මහජන පෙත්සම් | 515 | 1,762 | 1,019 | 1,258 |
| **එකතුව** | | **33,510** | **13,942** | **12,126** | **34,949** |

*** මෙහි දක්වා ඇත්තේ සිවිල් අංශයෙන් අවසන් කරන ලද නඩුගොනු සංඛ්‍යාව පමණි.** ඇතැම් නඩු ගොනු රාජ්‍ය නීතිඥ අංශය මගින් **අවසන් වේ.**

****** දත්ත වෙනස් වීමට අදාල කරුණු ඇමුණුම I මගින් දැක්වේ.

**** * 2020** වර්ෂයේ සිට ඉදිරියට ගෙන ආ නඩු ගොනු සංඛ්‍යාව = **901**

සක්‍රිය කරන ලද ගොනු සංඛ්‍යාව = **3818**

ඇමුණුම I

පී.ඩබ්.ප්‍රදීපිකා .

ශාඛා ප්‍රධානි .

අපරාධ අංශය .

2022.01.21

අතිරේක සොලිසිටර් ජනරාල්(පරිපාලන) .

නීතිපති දෙපාර්තමේන්තුව .

කොළඹ 12.

**<u>අපරාධ අංශයේ ප්‍රගති වාර්තාව නිවැරදි කිරීම</u>**

අපරාධ අංශයේ පවත්වාගෙන ආ ප්‍රගති වාර්තාවේ වැඩ අවසන් නොකළ ගොනුවල (Pending Advice Files) ශේෂය මා ශාඛා ප්‍රධානී වීමට පෙර සිටම පැවති වාර්තාව යාවත්කාලීන කරමින් ලබාගත් ශේෂයක් වේ.

2021 වර්ෂයේ අවසාන කාලයේ අප අංශයේ නිලධාරීන් විසින් අප අංශයේ ඇති සියලුම වැඩ අවසන් නොකළ ගොනු වල වලන පත්‍ර ආශ්‍රයෙන් එම ගොනු වල දත්ත පද්ධතියක් සකස් කළ අතර එහිදී වැඩ අවසන් නොකළ ගොනු වල ශේෂය නිවැරදිව ගණනය කරගත හැකිවිය. එවිට Pending Files ශේෂය පෙර සිට පවත්වාගෙන එන වාර්තාවෙන් එන ශේෂයට වඩා අඩු අගයක් වන අතර එය වඩා නිවැරදි අගය ද වේ.

එබැවින් අධිකරණ අමාත්‍යංශයට යවනු ලබන වාර්තාවේ 2021 වර්ෂය අවසාන Pending Advice Files ශේෂය අප විසින් සකස් කළ දත්ත පද්ධතියෙන් ලබාගත් නිවැරදි අගය වන ගොනු 6390 ක් ලෙස සඳහන් කර යැවීමට අවසර ලබා දෙන මෙන් ඉල්ලා සිටිමි.

මෙයට

.........................

Approved

21/1/22

## අභියෝග

නීතිපති දෙපාර්තමේන්තුවට මේ වන විට මුහුණපෑමට සිදු වී ඇති ප්‍රධාන අභියෝග කිපයකි.

01. රාජකාරි පරිශ්‍රයන්හි ඉඩකඩ අවම වීම හේතුවෙන් අනුමත ලැයිස්තුවට අදාල කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ ගැටලුවක් පවතී.
එයට තාවකාලික විසඳුමක් ලෙස ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 12 හි පිහිටි මෙඩි හවුස් ගොඩනැගිල්ල 2019.04.26 සිට කුලී පදනම මත කැබිනට් අනුමැතියට යටත්ව පරිහරණය කරනු ලබයි.
එහි සංස්ථා, ආගමන විගමන, ළමා ආරක්ෂණ, මහජන පෙත්සම් යන අංශ ස්ථාපනය කර ඇත.
කෙසේ නමුත් 2022 අප්‍රේල් වන විට මෙය මුදා හැරිය යුතු වන අතර දෙපාර්තමේන්තුවේ පැරණි ගොඩනැගිල්ලෙහි මෙම අංශ වලට ඉඩකඩ සළසා ස්ථාපනය කිරීමට පියවර ගැනීම අභියෝගයක්ව පවතී.

02. කොළඹින් පරිබාහිර වෙනත් පළාත් වල රාජකාරි කටයුතු කරන රජයේ අධිනීතිඥ වරුන් සඳහා අනුරාධපුර, බදුල්ල, . මන්නාරම යන ප්‍රදේශ වල නිල නිවාස ඉදිකර ඇත.
සෙසු ප්‍රදේශ වල රාජකාරියේ යෙදෙන රජයේ අධිනීතිඥ වරුන් පරිහරණය කරනු ලබන්නේ නීතිපති දෙපාර්තමේන්තුව විසින් කුලී පදනම මත වාර්ෂික බද්දකට යටත්ව තාවකාලික වශයෙන් ලබා ගත් නිල නිවාසය.

ඉහත සඳහන් කරුණු ප්‍රකාරව කොළඹින් පරිබාහිර ප්‍රදේශ වල රාජකාරියේ නිරතව සිටින රජයේ අධිනීතිඥවරුන් සඳහා ස්ථිර නිල නිවාස ස්ථාපනය කිරීමේ අවශ්‍යතාවය මතු වී තිබේ.

03. Covid – 19 වසංගතය සමග කාර්ය මණ්ඩලය සේවයට ගෙන්වා ගැනීම අභියෝගයක්ව පවතියි. මේ සම්බන්ධයෙන් ප්‍රවාහනය සලසා දීමට පියවර ගැනීම අභියෝගාත්මකය.

04. මෙම දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු විශාල ප්‍රමාණයක් පවතින හෙයින් දෛනික කටයුතු සාර්ථකව නිම කර ගැනීම ඉමහත් අභියෝගයකි.

## ඉදිරි ඉලක්ක

01. ශ්‍රී ලංකාවේ රාජ්‍ය නීති වෘත්තියට අදාල කරුණු පිළිබඳව විධිමත් පර්යේෂණ සිදුකිරීම.

02. නීතිපති දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන වෘත්තියමය සේවාවන්ගේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම.

03.දෙපාර්තමේන්තුවේ නීතිනිලධාරින් වෙත නෛතික පර්යේෂණයන් පිළිබඳව (LegalResearch) ක්‍රමවත් පුහුණුවක් ලබාදීම.

04. නීති නිලධාරින්ගේ නීති පර්යේෂණ කුසලතා (Legal Research skill) වර්ධනය කිරීම සඳහා අවස්ථා නිර්මාණය කිරීම.

05. ශ්‍රී ලංකාව හා අන්තර්ජාතික නෛතික ආයතන පථය අතර අන්‍යෝන්‍ය නෛතික සහයෝගිතාවය හා නෛතික තොරතුරු හුවමාරු කිරීමට විධිමත් නෛතික ජාලයක් ස්ථාපනය කිරීම.

06. නවතම නෛතික පර්යේෂණ යන්ත්‍ර (Legal Research Engines) හඳුන්වාදීම සහ සංවර්ධිත නෛතික දත්ත ගබඩාවක් සමගින් දෙපාර්තමේන්තුවේ පුස්තකාලයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.

07. නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් සඳහා නඩු ගොනු වල දත්ත සහිතව ඉලෙක්ට්‍රෝනික දින සටහන් පොතක් (E- diary) භාවිතය ප්‍රගුණ කිරීම.

09. නීතිපති දෙපාර්තමේන්තුව රජයට සපයනු ලබන නෛතික උපදෙස් විධිමත්ව සුරක්ෂණයකිරීම සඳහා මධ්‍යම ගබඩාවක් ස්ථාපනය කිරීම. (Central depository system regulate and retain the legal opinions dispatched by the Hon. Attorney General to the state)

10 .රජයේ අධිනීතිඥවරුන් සඳහා සිවිල් හා අපරාධ නඩු වල අභියාචනාධිකරණ නඩු මෙහෙය වීම සම්බන්දව විධිමත් පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

11. ඉලෙක්ට්‍රෝනික නඩු ගොනු කිරීම. ලේඛණ ගොනු කිරීම ආදිය පිලිබඳව රාජ්‍ය නිතිඥ අංශයේ නිලධාරීන්ට පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

..................................................................

ප්‍ර.ග.නි./ශ.නි./ආයතන ප්‍රධානියා

සංජේ රාජරත්නම්
ජනාධිපති නීතිඥ
නීතිපති

# පරිච්ඡේදය 03

# වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

# 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

## මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| අයවැය 2021 | | සටහන | තථ්‍ය 2021 | නැවත සලකා බලන ලද 2020 | |
|---|---|---|---|---|---|
| රු. | | | රු. | රු. | |
| 65,000,000 | ආදායම් ලැබීම් | | 143,779,404 | - | |
| - | ආදායම් බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| 65,000,000 | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 143,779,404 | 62,764,949 | |
| 65,000,000 | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **143,779,404** | 62,764,949 | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| | භාණ්ඩාගාර අග්‍රිම | | 1,427,733,000 | 1,831,350,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 52,614,821 | 25,775,467 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම | | 28,419,918 | 17,074,742 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| 65,000,000 | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | **1,508,767,739** | 1,874,200,209 | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **1,652,547,143** | 1,936,965,158 | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ) | | **1,386,945** | - | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **1,651,160,198** | 1,936,965,158 | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | පුනරාවර්තන වියදම් | | - | | |
| 1,115,000,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 1,000,272,394 | 998,036,039 | |
| 646,000,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 550,606,551 | 533,802,551 | ඒසීඒ-2(i) |
| 2,500,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 1,298,623 | 1,981,743 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| **1,763,500,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **1,552,177,568** | **1,533,820,333** | |
| | **මූලධන වියදම්** | | | | |
| 16,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 11,008,317 | 37,484,113 | |
| 68,500,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 55,357,704 | 328,462,266 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 25,000,000 | හැකියා වර්ධනය | 14 | 10,514,364 | 8,908,026 | |
| - | වෙනත් මූලධන වියදම් | 15 | - | - | |
| **109,500,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **76,880,385** | **374,854,405** | |
| | තැන්පතු ගෙවීම් | | 28,536,247 | 43,039,029 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 33,428,015 | 21,523,786 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **61,964,262** | **64,562,815** | |
| **1,873,000,000** | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **1,691,022,215** | **1,973,237,553** | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **(39,862,017)** | **(36,272,395)** | |
| | **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය** | | **(39,862,017)** | **36,272,395** | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | - | ඒසීඒ-3 |
| | | | **(39,862,017)** | **36,272,395** | |



17

ඒසීඒ-2

2021 දෙසැම්බර් 31 දිනට

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | 2021 රු. | 2020 රු. |
|---|---|---|---|
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 2,545,619,757 | 2,490,262,053 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම | ඒසීඒ-5/5(ඒ) | 59,036,595 | 54,028,498 |
| මුදල් සහ මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| මුළු වත්කම් | | 2,604,656,352 | 2,544,290,551 |
| <u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u> | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (1,297,270) | 17,773,207 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 2,545,619,757 | 2,490,262,053 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 60,333,865 | 36,255,291 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | | - |
| මුළු වගකීම් | | 2,604,656,352 | 2,544,290,551 |

පිටු අංක…**01**….සිට …**28**… දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක …**29**…. සිට …**30**…. දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ……………………… | ……………… | ……………………………………… |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 2022. 02. 28 | දිනය : 25. 02. 2022 | දිනය : 24 . 02 . 2022 |

එම්.එම්.පී.කේ. මායාදුන්නෙ
ලේකම්
අධිකරණ අමාත්‍යාංශය
උපරිමාධිකරණ සංකීර්ණය
කොළඹ 12.

සංජේ රාජරත්නම්
ජනාධිපති නීතිඥ
නීතිපති

# 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන | 2021<br>රු. | නැවත ගලපන ලද<br>2020<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| මුළු බදු ලැබීම් | | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | 143,779,404 | 62,764,949 |
| ලාභ | | - | - |
| ආදායම් නොවන ලැබීම් | | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | 36,970,283 | 35,770,594 |
| අග්‍රිම ලැබීම් | | 1,427,733,000 | 1,831,350,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | | 30,894,281 | 16,904,775 |
| තැන්පතු ලැබීම් | | 52,614,822 | 25,775,467 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ) | | 1,691,991,790 | 1,972,565,785 |
| | | | |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | 1,550,779,865 | 1,531,588,265 |
| සහනාධාර සහ මාරුකිරීම් | | 1,298,623 | 1,981,743 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | 1,978,211 | 1,333,711 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | 1,386,945 | - |
| අත්තිකාරම් ගෙවීම් | | 33,428,015 | 21,515,036 |
| තැන්පතු ගෙවීම් | | 28,536,247 | 43,039,029 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | | **1,617,407,906** | **1,599,457,784** |
| | | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ) | | 74,583,884 | 373,108,001 |
| | | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| පොලී | | 2,296,501 | 1,746,404 |
| ලාභාංශ | | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | - | - |
| උපණය අයකර ගැනීම් | | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | | **2,296,501** | **1,746,404** |
| | | | |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම | | 76,880,385 | 374,854,405 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | | **76,880,385** | **374,854,405** |
| | | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | | **(74,583,884)** | **(373,108,001)** |
| | | | |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| දේශීය ණය ගැනීම් | | - | - |
| විදේශීය ණය ගැනීම් | | - | - |
| ප්‍රදානයන් ලැබීම් | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | | - | - |
| | | | |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | | - | - |
| | | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | | - | - |
| | | | |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | | - | - |

## 3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

## 3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව රු. | අවසන් ඇස්තමේන්තුව රු. | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 20.03.02.11 | සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල වලින් ලැබෙන නෛතික ගාස්තු | 65,000,000 | 65,000,000 | 89,406,314 | 138% |

## 3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම රු. | උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන. අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය රු. | අවසාන ප්‍රතිපාදනය රු. | | |
| පුනරාවර්තන | 1,763,500,000 | 1,763,500,000 | 1,552,177,568 | 88% |
| ප්‍රාග්ධන | 109,500 | 109,500,000 | 76,880,385 | 70% |

**3.8** **මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන**

රු. .000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදනව% ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| - | - | - | - | - | - | - |

**3.9** **මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය**

රු. .000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2020 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2020 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිතය | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 698,485 | 698,485 | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | 717,656 | 717,656 | | |
| 9153 | ඉඩම් | 357,600 | 357,600 | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | | |

මගේ අංකය / எனது இல. / My No. JLO/B/AGD/FA/2021/64/C
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2022 ජුනි 16 දින

නීතිපති (ගණන්දීමේ නිලධාරී)

නීතිපති දෙපාර්තමේන්තුව

**නීතිපති දෙපාර්තමේන්තුවේ 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

නීතිපති දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට නීතිපති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි

අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

#### 1.6.1.1 ආදායම් ලැබීම්

(අ) 2021 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා සංස්ථා අංශය විසින් සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල නෛතික ගාස්තු සඳහා බිල් කල ආදායම රු.78,319,557 ක් වූ අතර ඉන් රු.31,537 ,787 ක් සමාලෝචිත වර්ෂය තුල අය කරගෙන තිබුණි.මේ අනුව සමාලෝචිත වර්ෂයෙ දෙසැම්බර් 31 දිනට හිඟහිටි ආදායම රු.46,781,770 ක් වූවත් මූල්‍ය ප්‍රකාශනවල (ACA – 1(1) ) හිඟහිටි ආදායම ලෙස රු.46,154,860 ක් දක්වා තිබූ බැවින් සමාලෝචිත වර්ෂයේ හිඟ ආදායමේ රු.626,910 ක වෙනසක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙහි ACA 1(i) ආකෘතියෙහි පසුගිය වසරට පෙර වසර සඳහා හිඟ ආදායම් ශේෂය දැක්වීමේ දී පසුගිය වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ ශේෂය හා සමාලෝචිත වසර ආරම්භයේ පැවති ශේෂය අතර රු.12,311,617 ක වෙනස්කම් වූ අතර ඒ සඳහා හෙළිදරව් කිරීම් ඉදිරිපත් කර නොතිබුණි.

#### 1.6.1.2 පුනරාවර්තන හා මූලධන වියදම්

මුදල් රෙගුලාසි 65(1) ප්‍රකාරව ශීර්ෂ, වැඩසටහන්, ව්‍යාපෘති, වැය විෂයයන්, වැය අංක සහ මූල්‍ය විස්තර යටතේ ප්‍රතිපාදනය කරන ලද නිශ්චිත කාර්යයන් සහ මුදල් ප්‍රමාණයෙන් නිසි අධිකාරි බලය නොමැතිව වෙනස් කල නොහැකි බව සඳහන් වීම මත ඒ ඒ වැය විෂයයන් වලට අයත් වියදම් ඒ ඒ වැය විෂයයන් වලටම ගිණුම්ගත කල යුතු වූවද නියැදි විගණන පරීක්ෂණයට අනුව සම්මත වැය විෂයයන්ට අයත් නොවන එකතුව රු.6,869,252 ක වියදම් (මාරු පත්‍ර මඟින් සිදුකල ගැලපීම්වලින් පසුව) සාවද්‍ය ලෙස වෙනත් වැය විෂයයන්වල සටහන් කර තිබීම නිසා වාර්ෂික මූල්‍ය ප්‍රකාශනයේ ඒසීඒ 2 (i), ඒසීඒ 2(ii) ඒසීඒ 3 (iii)හි සඳහන් වියදම්වල සාවද්‍ය තත්ත්වයක් මූල්‍ය ප්‍රකාශන මගින් පෙන්නුම් කෙරුණි.

### 1.6.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

එක් එක් ණයගැතියන්ගෙන් අයකර ගෙන තිබූ ශේෂය හඳුනා ගත හැකිවන පරිදි හිඟ අදායම් අය කිරීමේ උපලේඛණයක් ඉදිරිපත් නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අයකර ගෙන තිබූ රු.57,241,617 ක හිඟ ආදායම් අයකිරීම්වල නිරවද්‍යතාවය පිළිබඳව විගණනයේ දී සෑහීමකට පත්විය නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

#### (අ) ආදායම් අයකර ගැනීමේ දුර්වලතා

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ඉකුත් වර්ෂයට අදාල හිඟ ආදායම රු.75,591,785 ක් වූ අතර ඉකුත් වර්ෂයට පෙර වර්ෂවලට අදාල හිඟ ආදායම රු.245,551,757ක් විය. ඉන් සමාලෝචිත වර්ෂයේ අයකිරීම් පිළිවෙලින් රු.40,039,787ක් හා රු.17,201,830ක් වූ අතර එය සියයට 52 ක් සහ සියයට 7 ක් වැනි අඩු ප්‍රතිශතයක් ගෙන තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය අවසානයට සමස්ථ හිඟහිටි ආදායම රු.310,056,785 ක් විය.

#### (ආ) ආදායම් තත්ත්වයන් කලින් කලට සමාලෝචනය නොකිරීම

2015 ජුලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව පවතින ආර්ථික තත්ත්වයන්ගේ වෙනස්කම් සැලකිල්ලට ගනිමින් සේවාවන් සඳහා අය කරනු ලබන ගාස්තු එම සේවාවන් සැපයීම සඳහා වන වියදම් සැලකිල්ලට ගනිමින් කලානුරූපීව සංශෝධනය කල යුතුය. කෙසේ වෙතත් නීතිපති දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂය සඳහා රු.78,319,557 ක ආදායමක් (බිල්කල ආදායම) රැස්කර ගැනීම සඳහා විශේෂිත කාර්යමණ්ඩල වැටුප් හා ප්‍රසාද දීමනා නීති නිලධාරීන්ට ගෙවන විශේෂ දීමනා,ප්‍රසාද දීමනා ලිපිද්‍රව්‍ය ඇතුළු වියදම් සඳහා රු.89,982,869 ක වියදමක් දරා තිබූ බව දෙපාර්තමේන්තු ආදායම් ලෙජර හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව තහවුරු විය

### 2.2 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව, දෙපාර්තමේන්තුවට අදාල ඇස්තමේන්තු සකස් නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන සලසා තිබූ සමස්ත පුනරාවර්තන වැය විෂයන් 19 කින් පුනරාවර්තන වැය විෂයන් 05ක් සහ එක් මූලධන වැය විෂයයක් වෙත සලසා තිබුණු රු.40,300,000 ක ප්‍රතිපාදන වෙනත් පුනරාවර්තන වැය විෂයන් 03ක් සහ එක් මූලධන වැය විෂයක් වෙත මාරු කර තිබූ බැවින් ඉහතින් සඳහන් මුදල් රෙගුලාසියේ අවශ්‍යතා සපුරාලන පරිදි කටයුතු කරමින් තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි.

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ (සටහන III) හි හෝ භාණ්ඩාගාරයේ බැඳීම් හා බැරකම් පිළිබඳ වාර්තාවේ (SA 92 හි) බැරකම් කිසිවක් සටහන් කර නොතිබූ නමුත් දෙපාර්තමේන්තුව අවස්ථා 26 ක් යටතේ වූ රු.9,008,408 ක බැරකම් සඳහා 2022 වර්ෂයේදී ගෙවීම් කර තිබුණි.

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නීතිරීති රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| I. මුදල් රෙගුලාසි 104(1) අ | මෝටර් වාහන හදිසි අනතුරු 33 ක් සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් හෝ පවත්වා නොතිබුණි. |
| II. මුදල් රෙගුලාසි 273 | එකතුව රු.550,015 ක් වූ මෝටර් වාහන අළුත්වැඩියාවන් 07 කට අදාලව කාර්මික නිලධාරියකුගේ සහතිකයක් ලබා ගැනීමෙන් තොරව ගෙවීම් කර තිබුණි. |
| III. මුදල් රෙගුලාසි 232(2) | වවුචර් පත් වල අඩංගු මුදල් අකුරෙන් හා ඉලක්කමෙන් දැක්විය යුතු වුවත් ගෙවීම් වවුචර්පත් බොහොමයක ගෙවන මුදල අකුරෙන් දක්වා නොතිබුණි. |
| IV. මුදල් රෙගුලාසි 237 | ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කිරීමේ දී ගෙවීම් වවුචරයේ අදාල භාණ්ඩ ලැබී ඇති බවට හා අදාල බඩු ලේඛණයේ තොග පොත් යනාදියේ ඇතුලත් කල බවට සහතිකයක් අමුණා නොතිබුණි. |

| | |
|---|---|
| V. මුදල් රෙගුලාසි 395 (ඇ) | එක් එක් මාසයේ ඇති ගණුදෙණු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශ පිලියෙල කල යුතු වූවද දෙපාර්තමේන්තුව බැංකු සැසඳුම් ප්‍රකාශ මාස 02 කට වැඩි කාල පමාවක් ඇතිව පිලියෙල කර තිබුණි. |
| VI. මුදල් රෙගුලාසි 1642 | සමාලෝචිත වර්ෂය තුල සිදු වී තිබුණු මෝටර් වාහන අනතුරු 33 කදී පොලිසියට වාර්තා කර නොතිබුණි. |
| (ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | දෙපාර්තමේන්තුව සතු වාහන 101 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. |
| (ඇ) රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 4.2.2 වගන්තිය | ප්‍රසම්පාදන කටයුතු ආරම්භ වීමේ අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි විස්තර දැක්වෙන පරිදි විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. |

## 2.5 තැන්පතු ගිණුම්

2020 දෙසැම්බර් 31 දින චෙක්පත් මඟින් විවිධ සැපයුම් හා සේවා සඳහා ගෙවීම් කරන බව ගෙවීම් වවුචර්වල සඳහන් කරමින් වැය විෂයයන් හර කර චෙක්පත් ලියා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රජයේ මුදල්වලට අදාල රු.27,271,695 ක චෙක්පත් 07 ක් මාස 08 කට වැඩි කාලයක් දෙපාර්තමේන්තුව තුල රඳවා තබාගෙන 2021 අගෝස්තු සහ දෙසැම්බර් මාසවල පොදු තැන්පත් ගිණුම්මට බැරකර තිබුණි. 2021.12.31 වන විටත් මෙම ගෙවීම් සිදු කර නොතිබුණි. මේ අනුව රජයේ මුදල් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රඳවා තබා ගැනීමට කටයුතු කර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1.1 කාර්යසාධනය

**<u>සැලසුම් කිරීම</u>**

දෙපාර්තමේන්තුව විසින් සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන චක්‍රලේඛය ප්‍රකාරව ඇතුලත් කළයුතු ප්‍රමුඛතා අනුව සකස් කල ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත නිමවුම් මට්ටම ඇතුලත් කර නොතිබුණි.

### 3.1.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත්කල මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාවේ කෙටුම්පතක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 3.2 පාඩු හා හානි

රජයට උපරිම වාසියක් ලැබෙන පරිදි රජයෙන් කරන ගෙවීම කිරීමට ගණන්දීමේ නිලධාරියා කටයුතු කලයුතු වුවද කුලී පදනමට ලබා ගෙන තිබූ ගොඩනැගිල්ලක් සඳහා විදුලි බිල්පත් ගෙවීමේ දී මාසික විදුලි පරිභෝජන වියදමට අමතරව එකතුව රු.143,964 ක් වූ අධික ගෙවීමක් සිදු කර තිබූ බව 2021 ජනවාරි සිට මැයි දක්වා ගෙවීම් වවුචර් පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

### 3.3 අනාර්ථික ගණුදෙනු

කොවිඩ් වසංගත තත්ත්වයේ බලපෑම නිසා රට ආර්ථික වශයෙන් දැඩි අර්බුදකාරී තත්ත්වයන්ට පත්ව රාජ්‍ය ආදායම් ලබා ගැනීම දැඩි සීමාකාරී තත්ත්වයන් යටතේ ක්‍රියාත්මක වෙමින් තිබිය දී සමාලෝචිත වර්ෂය තුල නීතිපති දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද කෙටි රැස්වීම්, සාකච්ඡා සඳහා සංග්‍රහ වියදම් ලෙස රු.4,023,840 ක් වැය කර තිබුණි.

### 3.4 කළමනාකරණ දුර්වලතා

(අ) මුදල් රෙගුලාසි 177 (I) ප්‍රකාරව දෛනිකව රැස්කරනු ලබන ආදායම කාලප්‍රමාදයකින් තොරව රජයේ ආදායමට ගිණුම්ගත කළයුතු වුවද, නීතිපති දෙපාර්තමේන්තුවේ දෛනිකව රැස්කර තිබූ ආදායම රජයේ ආදායමට ගිණුම් ගත කිරීම දින 07 ත් දින 21 ත් අතර කාල පමාවකින් පසුව සිදු කර තිබුණි.

(ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සුළු මුදල් අග්‍රිමයෙන් එකවර ගෙවීමේ දී රු.5,000 ක සීමාව නොඉක්මවිය යුතු වුවත් මන්නාරම රජයේ අධිකරණ නිල නිවස සඳහා වූ රු.20,000 ක සුළු මුදල් අග්‍රිමයෙන් රු.5,000ට වැඩි වියදම් සඳහා අවස්ථා 03 කදී එකතුව රු.38,600 ක් ගෙවීම් සිදු කර තිබුණි.

4. **මානව සම්පත් කළමනාකරණය**

---

(අ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රජය රජයේ ආයතන සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා අවශ්‍ය සියළුම නෛතික සේවාවන් සහ නීති උපදෙස් නොපමාව සැපයීම සහ රජයේ පුළුල් අරමුණු ව්‍යාප්ත කිරීමේ දී සුවිශේෂී කාර්යන් සඳහා දායක වන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු වලට අදාල මුළු කාර්ය මණ්ඩලයෙන් 305ක එනම් සියයට 58ක පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබීම දෙපාර්තමේන්තු කාර්ය සාධනය කෙරෙහි සෘජුවම බලපා තිබුණි.

එම්. සෝමතිලක
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

එම්. සෝමතිලක
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

# 04 පරිච්ඡේදය

# කාර්ය සාධන දර්ශක

**4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)**

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | | | |
|---|---|---|---|---|---|
| | 0% - 20% | 21% - 40% | 41% - 60% | 61% - 80% | 81% - 100% |
| 01.දෙපාර්තමේන්තුවේ නිලධාරීන්හට නෛතික පර්යේෂණයන් පිළිබඳව ක්‍රමවත් පුහුණු ලබාදීම. | | | ✓ | | |
| 02. නීති නිලධාරීන්ගේ නීති පර්යේෂණ කුසලතා (Legal Research) වර්ධනය කිරීම සඳහා අවස්ථා නිර්මාණය කිරීම. | | ✓ | | | |
| 03. නවතම නෛතික පර්යේෂණ යන්ත්‍ර (Legal Research Engines) හඳුන්වාදීම සහ උසස් නෛතික දත්ත ගබඩාවක් සමගින් දෙපාර්තමේන්තුවේ පුස්තකාලයේ ගුණාත්මකභාවය ඉහල නැංවීම. | | | | ✓ | |
| 04. නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා නඩු ගොනු වල දත්ත සහිතව ඉලෙක්ට්‍රෝනික දින සටහන් පොතක් (E- diay) භාවිතය කරා නිලධාරීන් යොමු කිරීම | | | | ✓ | |
| 05. ඩිජිටල් තාක්ෂණය ඔස්සේ නඩු සැසි වලට සහභාගී වීම, ලේඛණ ගොනු කිරීම ආදිය වෙත නිලධාරීන් යොමු කිරීම සහ ඒ සම්බන්ද පුහුණු වීම් ලබා දීම. | | | ✓ | | |

# 05 පරිච්ඡේදය

# තිරසර සංවර්ධන අරමුණු (SDG)සපුරා ගැනීමේ කාර්ය සාධනය

**5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.**

රාජ්‍ය ආයතන, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා තිරසර සංවර්ධනයේ අභිමතාර්ථයන් සාර්ථක කර ගැනීමසඳහා අවශ්‍ය සියලුම නෛතික සේවාවන් සහ නීති උපදෙස් නොපමාව සැපයීම මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරයි.

2021 වර්ෂය සඳහා හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සපුරා ගැනීම සඳහා මේ වන විට වැඩසටහන් රාශියක් ක්‍රියාත්මකව පවතී.

**5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.**

තිරසර සංවර්ධනයේ අභිමතාර්ථයන් සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය වෙත නීතිපතිදෙපාර්තමේන්තුවේ සහය අප්‍රමාදීව ලබාදීම සඳහා දෙපාර්තමේන්තුවේ සියලු කාර්යයන්හි හා එම කාර්යයන් ඉටු කිරීම සඳහා ඉහළ දායකත්වයක් සපයන සියලුම කාර්ය මණ්ඩලයේ ගුණාත්මක බව හා ප්‍රමාණාත්මක බව මෙන්ම කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තරික වැඩසටහන් රාශියක් ක්‍රියාත්මකව පවතී.

එනම් සිවිල් අංශය. අපරාධ අංශය සහ රාජ්‍ය නීතිඥ අංශය ලෙස ප්‍රධාන අංශ තුනක් මගින් සිවිල් සහ අපරාධ නඩු සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ උපදෙස් ලබා දීම සිදුකරනු ලබයි. ප්‍රධාන අංශ තුනෙහි කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණ අංශය. සංස්ථා අංශය. ළමා ආරක්ෂණ අංශය. මහජන පැමිණිලි අංශය වශයෙන් විශේෂිත වූ ඒකක පිහිටුවා ඇත.

# 06 පරිච්ඡේදය

# මානව සම්පත් පැතිකඩ

## කාර්ය මණ්ඩල තොරතුරු (2021.12.31 දිනට)

| සේවක කාණ්ඩ මට්ටම | තනතුර | අනුමත කාර්යය මණ්ඩලය | දැනට සිටින කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | නීතිපති | 1 | 1 | - |
| | සොලිසිටර් ජනරාල් | 1 | 1 | - |
| | ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් | 2 | 2 | 0 |
| | අතිරේක සොලිසිටර් ජනරාල් | 14 | 14 | - |
| | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් | 9 | 7 | 2 |
| | නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් | 28 | 10 | 18 |
| | ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ | 56 | 28 | 28 |
| | රජයේ අධිනීතිඥ | 218 | 132 | 86 |
| | සහකාර රජයේ අධිනීතිඥ (පරිවාස) | 130 | 3 | 127 |
| | ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නීතිඥ | 1 | - | 1 |
| | රාජ්‍ය නීතිඥ | 4 | 2 | 2 |
| | ජ්‍යෙෂ්ඨ සහකාර රාජ්‍ය නීතිඥ | 6 | 4 | 2 |
| | සහකාර රාජ්‍ය නීතිඥ | 18 | 6 | 12 |
| | කණිෂ්ඨ සහකාර රාජ්‍ය නීතිඥ | 28 | 11 | 17 |
| | අධ්‍යක්ෂ (පාලන) | 1 | - | 1 |
| | ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | - |
| | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | - |
| | සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන) | 1 | - | 1 |
| | නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | 1 | - | 1 |
| | ඉංජිනේරු (නඩත්තු කටයුතු) | 1 | - | 1 |
| තෘතීය මට්ටම | පරිපාලන නිලධාරී * | 3 | - | 3 |
| | පුස්තකාලයාධිපති (අධි ශ්‍රේණිය) | 1 | - | 1 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 2 | - | 2 |
| | භාෂා පරිවර්තක | 8 | 5<br>2<br>(කොන්ත්‍රාත්) | 3 |
| | සංඛ්‍යාලේඛන නිලධාරී | 1 | 1 | - |
| ද්විතීය මට්ටම | සංවර්ධන නිලධාරී ** | 3 | 2 | 1 |
| | පුස්තකාලයාධිපති | 5 | 4 | 1 |
| | තාක්ෂණ නිලධාරී (නඩත්තු කටයුතු) | 1 | - | 1 |
| | තොරතුරු තාක්ෂණ සහකාර | 5 | - | 5 |
| | කළමනාකරණ සේවා නිලධාරී | 180 | 130 | 50 |
| | සම්බන්ධීකරණ ලේකම් | 1 | 1 | - |
| | පෞද්ගලික සහකාර | 1 | 1 | - |
| | උසාවි ලිපිකරු | 60 | - | 60 |
| | ලඝු ලේඛක | 78 | 1 | 77 |
| | දෙපාර්තමේන්තුගත ලිපිකරු<br>(ලිපිකරු/ගිණුම් ලිපිකරු/යතුරු ලේඛක) | 24 | 24 | - |
| ප්‍රාථමික මට්ටම | රියදුරු | 137 | 70 | 67 |
| | කාර්යාල සේවක සේවය | 239 | 197 | 42 |
| | දෙපාර්තමේන්තුගත කාර්යාල සේවක සේවය | 19 | 19 | - |
| | මුරකරු | 7 | 3 | 4 |
| | නඩත්තු සහායක | 2 | - | 2 |
| | එකතුව | **1299** | **683** | **618** |

* පරිපාලන නිලධාරී තනතුරෙහි වැඩ බැලීම සඳහා කළමනාකරණ සේවා නිලධාරී සේවයේ I ශ්‍රේණියේ නිලධාරිනියන් තිදෙනෙක් පත් කර ඇත.

** අයවැය සහකාර තනතුර සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කර ඇත.

06.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ශ්‍රී ලංකාව වෙනුවෙන් සහ එහි ජීවත්වන සියලුම ජනතාව වෙනුවෙන් යුක්තිය හා සාධාරණත්වය ඉෂ්ඨ කිරීම සඳහා එලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලියේ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය ලෙස නීතිපති දෙපාර්තමේන්තුව ක්‍රියා කරන අතර සිය සේවාවන් අප්‍රමාදීව ලබා දීම සඳහා දෙපාර්තමේන්තුවේ පවතින කාර්ය මණ්ඩලය ඉතා ඉහළ දායකත්වයක් සපයයි.

නමුත් අනුමත සේවක සංඛ්‍යාවට වඩා අඩු සේවක සංඛ්‍යාවක් පැවතීම හේතුවෙන් මෙම මානව සම්පත් හිඟය දෙපාර්තමේන්තු කාර්යයන්හි කාර්යක්ෂමතාවය කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කර ඇත.

**06.3 මානව සම්පත් සංවර්ධනය**

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (රු. 000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| Public Service Disciplinary Procedures | 03 | දින 03 | 15 | - | දේශීය | The meaning of discipline, Disciplinary order, Punishment appeals, Related acts, statutes & circulars. |

මීට අමතරව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ වෙනත් ආයතන හරහා නිති නිලධාරීන්ට පුහුණු වීම සඳහා අවස්ථාව ලබා දීම

***ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.**

දෙපාර්තමේන්තුවේ නීති සහ නීති නොවන නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය මගින් රජය සහ මහජනතාව වෙත ගුණාත්මක බවින් ඉහළ කාර්යක්ෂම සේවයක් ලබා දීම උදෙසා පුහුණු වැඩසටහන් මගින් විශාල දායකත්වයක් ලැබී ඇත.

කෙසේ වුවද පැවති covid – 19 වසංගත තත්වය හේතුවෙන් බොහෝ පුහුණු වැඩසටහන් නොපැවැත්විණි.

# 07 පරිච්ඡේදය

# අනුකූලතා වාර්තාව

## 07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නැත | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නැත | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාල නැත | | |
| 1.6 | වෙනත් | අදාල නැත | | |
| **2** | **පොත්පත් හා ලේඛන තඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **03** | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මූ.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව. රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 4.4 | වාර්පික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්පික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2)DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | සියලුම විගණන වාර්තා සඳහා මසක් ඇතුලත පිළිතුරු සපයා නොමැත | විගණන වාර්තා සඳහා මසක් ඇතුලත පිළිතුරු සැපයීමට කටයුතු කිරීම |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්පය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල නොවේ | පැවති covid-19 තත්ත්වය හේතුවෙන් රැස්වීම් 04 ක් පැවැත්විය නොහැකි විය.<br><br>(කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ | ඉදිරියේ දි කාර්තුවකට 01 බැගින් විගණන හා කළමනාකරණ රැස්වීම් පැවැත්වීමට කටයුතු කිරීම |

| | | | | |
|---|---|---|---|---|
| | | | අංක DMA/ACM/M2021/20 අනුව කටයුතු කර ඇත | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | covid-19 වසංගත තත්ත්වය තුළ පිට පළාත් භාණ්ඩ සමීක්ෂණ කටයුතු අඩාල වීම | නියමිත දිනට අදාල තාක්ෂණ කමිටු නම් කර ක්‍රියාත්මක කිරීම |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල නොවේ | covid-19 වසංගත තත්ත්වය තුළ පිට පළාත් භාණ්ඩ සමීක්ෂණ කටයුතු අඩාල වීම | නියමිත දිනට අදාල අපහරණ කමිටු නම් කර ක්‍රියාත්මක කිරීම |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල නොවේ | covid-19 වසංගත තත්ත්වය තුළ පිට පළාත් භාණ්ඩ සමීක්ෂණ කටයුතු අඩාල වීම | නියමිත පරිදි ක්‍රියාත්මක කිරීම |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මූ.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල නොවේ | | අතිරේක සොලිසිටර් ජනරාල් (පරිපාලන) ගේ උපදෙස් පරිදි 2021.11.19 දිනෙන් පසුව සිදුවන සෑම අනතුරක් සම්බන්ධයෙන්ම පරීක්ෂණ පවත්වන අතර ඒ සඳහා කමිටුවක් පත් කර ඇත. |
| 9.5 | 2016.12.29 දිනැති අංකද 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්පයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අදාළ නොවේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මූ.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | ක්‍රියා මාර්ග ප්‍රමාද වීම | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දි මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම. එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | අදාළ නිලධාරීන් නිරවුල් කිරීම ප්‍රමාද කිරීම | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව. රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල නොවේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 15.3 | මු.රෙ. 176 අනුව හිග ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගෙන් ප්‍රශංසා/චෝදනා පළ කිරීමට පහසුකම් සළසා තිබීම | කොටසක් අනුකූල වේ | දෙපාර්තමේන්තමේන්තු වට පවතින සුවිශේෂි කාර්යභාරය මත මහජනතාව සඳහා නිතිපතිතුමා වෙත ස්වකිය ගැටලු ඉදිරිපත් කිරීමට මහජන පෙත්සම් අංශය ඉහළ අධිකරණ නිලධාරියෙකු හරහා සම්බන්ධිකරණය වේ. | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභි ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල නොවේ | දෙපාර්තමේන්තුව තුල පැවති පරිපාලන නිලධාරින්ගේ හිඟය සහ Covid-19 වසංගත තත්වය මේ සඳහා හේතු විය | 2022 වර්ෂයේදී සකස් කිරීම |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි. පුරවැසි/ සේවාලාභි ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | දෙපාර්තමේන්තුව තුල පැවති පරිපාලන නිලධාරින්ගේ හිඟය සහ Covid-19 වසංගත තත්වය මේ සඳහා හේතු විය | 2022 වර්ෂයේදී සකස් කිරීම |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | දෙපාර්තමේන්තුව තුල පැවති පරිපාලන නිලධාරින්ගේ හිඟය සහ Covid-19 වසංගත තත්වය මේ සඳහා හේතු විය | 2022 වර්ෂයේදී මානව සම්පත් සැලැස්මක් සකස් කිරීම |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල නොවේ | කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයන් පිරිසකට පුහුණු අවස්ථාවන් ලබා දී ඇති නමුත් දෙපාර්තමේන්තුවට පැවරී ඇති සුවිශේෂී කාර්යභාරය සහ මානව සම්පත් හිඟය හේතුවෙන් කාර්ය මණ්ඩලයේ කාර්යබහුලත්වය මත කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම පුහුණු අවස්ථාවන් ලබා දීමට නොහැකි වී ඇත. | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම පුහුණු අවස්ථාවක් ලබා දීම |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්තකාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | දෙපාර්තමේන්තුව තුල පැවති පරිපාලන නිලධාරින්ගේ හිඟය සහ Covid-19 වසංගත තත්වය මේ සඳහා හේතු විය | සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම සකස් කිරීම |

| | | | | |
|---|---|---|---|---|
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම. ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම. නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල නොවේ | දෙපාර්තමේන්තුව තුල පැවති පරිපාලන නිලධාරීන්ගේ හිඟය සහ Covid-19 වසංගත තත්වය මේ සඳහා හේතු විය | සුදුසුකම් ඇති ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු මේ සඳහා පත් කිරීම |
| **20** | **විගණිත ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |